| විභාග අංකය : |
|---|
| |

කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

*දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය*

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

ව්‍යාපාර කළමනාකරණවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2013

ජනවාරි - 2017

**BMGT E3055 – සංවිධාන චර්යාව**

කාලය : පැය 03

මෙම ප්‍රශ්න පත්‍රය I කොටස හා II කොටස ලෙස කොටස් දෙකකින් (02) සමන්විතය.

**උපදෙස්**

(i) I කොටසේ සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) I කොටස බහුවරණ ප්‍රශ්න 10 කින් සහ කෙටි ප්‍රශ්න 06 කින් සමන්විත වේ. I කොටස සඳහා සම්පූර්ණ ලකුණු 40 කි.

(iii) II කොටස ප්‍රශ්න 05 කින් සමන්විත වන අතර ඔබ පිළිතුරු සැපයිය යුත්තේ ප්‍රශ්න 03 කට පමණි. සෑම ප්‍රශ්නයකටම සමාන ලකුණු හිමි වේ. II කොටස සඳහා සම්පූර්ණ ලකුණු 60 කි.

(iv) I කොටස සඳහා ප්‍රශ්න පත්‍රයේම පිළිතුරු සැපයීම අනිවාර්ය වන අතර, එය II කොටසේ පිළිතුරු ඇතුලත් පත්‍රයට ඇමිණිය යුතුය.

(v) ප්‍රශ්න පත්‍රයේ I කොටස කිසිසේත්ම විභාග ශාලාවෙන් පිටතට ගෙන නොයා යුතුය.

## I - කොටස

පහත සඳහන් එක් එක් ප්‍රශ්නය සඳහා වඩාත්ම යෝග්‍ය වූ පිළිතුර යටින් ඉරක් අඳින්න.

01. වර්තමාන සන්දර්භය තුල, සංවිධාන චර්යා අධ්‍යයනයේ අභියෝගයන් වනුයේ,

(අ) සේවක අපේක්ෂාවන්

(ආ) කාර්යමණ්ඩල විවිධත්වය

(ඇ) ගෝලීයකරණය

(ඈ) ඉහත සියල්ලම

02. සමාජ මඟහැරීම (Social Loafing) යනු කුමක්ද?

(අ) පුද්ගලයින් තනියම වැඩ කරනවාට වඩා අඩු වෙහෙසකින් කණ්ඩායම තුළදී වැඩ කිරීමේ ක්‍රියාවලියයි.

(ආ) පුද්ගලයින් කණ්ඩායම් තුළ සිටිනවිට, වඩා වෙහෙස වී වැඩ කිරීමේ ක්‍රියාවලියකි

(ඇ) කණ්ඩායමකට අයත්වීම නිසා අයෙක් අනිත් අය සමඟ ගැවසීම සහ අන්‍යෝන්‍ය සුහදශීලීත්වය විඳීම

(ඈ) කණ්ඩායම් කුසලතා වර්ධන ක්‍රියාකාරකම්

03. අත්දැකීම්වල ප්‍රතිඵලයන් ලෙස සාපේක්ෂ වශයෙන් හැසිරීමේ ස්ථාවර වූ වෙනසක් ඇති වන්නේ පහත සඳහන් කුමන ආකාරයෙන්ද?

(අ) ඉගෙනීම

(ආ) තෝරා ගැනීම

(ඇ) පෞරුෂත්වය

(ඈ) කණ්ඩායම් සිතීම

04. පර්යේෂකයින් පෙන්වා දී ඇති ආකාරයට පුද්ගල සම්බන්ධතා හේතුකොටගෙන ඇතිවන ගැටුම්,

(අ) හිතකර වේ.

(ආ) අහිතකර වේ.

(ඇ) චිත්තවේගී වේ.

(ඈ) වටහා ගැනීමට දුෂ්කර වේ.

05. කබඩ් එකක් විවෘත කිරීමේදී බළලෙකු ආහාර අපේක්ෂාවෙන් ප්‍රතිචාර දක්වන විට, කබඩ් එක විවෘත කිරීම,

(අ) ආරෝපිත ප්‍රතිචාරයයි

(ආ) අනාරෝපිත උත්තේජකයයි

(ඇ) ආරෝපිත උත්තේජකයයි

(ඈ) අනාරෝපිත ප්‍රතිචාරයයි

06. සංවිධානයක බල මූලාශ්‍ර සම්බන්ධයෙන් පහත දැක්වෙන ප්‍රකාශ අතුරින් වැරදි ප්‍රකාශය කුමක්ද?

(අ) කළමනාකරුවකු විසින් තමා යටතේ සිටින්නකුගේ කාර්යසාධනය සඳහා ධනාත්මක ප්‍රතිඵල යොදා ගැනීම තුලින් ත්‍යාග බලය ලැබේ.

(ආ) කළමනාකරුවකුගේ තාක්ෂණික දැනුම තුලින් විශේෂඥතා බලය උපදී.

(ඇ) සංවිධානයක තොරතුරු පාලනය හා බෙදාහැරීම තුලින් තොරතුරු බලය ලැබේ.

(ඈ) පුද්ගල බල මූලාශ්‍ර සංවිධානයක තනතුර හරහා ගලා එයි.

07. සංවිධානයක හිතකර හා අහිතකර ගැටුම් සම්බන්ධයෙන් පහත ප්‍රකාශ අතරින් වැරදි ප්‍රකාශය කුමක්ද?

(අ) කණ්ඩායම් කාර්යඵලවලට බාධාකරන විට ගැටුම් අහිතකර වේ.

(ආ) ගැටුම් කළමනාකරණය යන්නට ගැටුම් යහපත් මට්ටමක පවත්වාගෙන යාම ඇතුලත් නොවේ.

(ඇ) එක් කණ්ඩායමකට යහපත් වන ගැටුමක් තවත් කණ්ඩායමකට අයහපත් විය හැක.

(ඈ) අයහපත්බවින් වැඩි ගැටුම් විශ්වාසය අවම කළ හැක.

08. පහත දැක්වෙන න්‍යායන් අතුරින් ඉගෙනුම් න්‍යායක් නොවන්නේ කුමක්ද?

(අ) සම්ප්‍රදායික තත්වාරෝපිත

(ආ) ඔපරන්ට් තත්වාරෝපිත

(ඇ) ෆීඩ්ලර්ගේ න්‍යාය

(ඈ) සමාජ ඉගෙනුම

09. පහත සඳහන් ලක්ෂණ අතරින් පංච පෞරුෂත්ව ආකෘතියට අදාළ ලක්ෂණයක් වන්නේ කුමක්ද?

(අ) පාලන පථය

(ආ) ස්වයං නිරීක්ෂණය

(ඇ) මැකියාවෙලියතාවය

(ඈ) හැඟීම් ස්ථායිතාවය

10. පුද්ගලයන් තම පරිසරය සම්බන්ධයෙන් අර්ථයන් ඇතිකර ගැනීම පිණිස පංචේන්ද්‍රියන් තුළින් ලබා ගන්නා තොරතුරු සංවිධානය හා විග්‍රහ කිරීමේ ක්‍රියාවලිය හඳුන්වනු ලබන්නේ,

(අ) පෞරුෂත්වය

(ආ) සංජානනය

(ඇ) ආකල්ප

(ඈ) අභිප්‍රේරණය ලෙසයි.

(10 x ලකුණු 02 = ලකුණු 20)

11. ආකල්ප සම්බන්ධයෙන් වූ ප්‍රධාන අංග තුන (03) නම් කරන්න.

..............................................................................................................................................

..............................................................................................................................................

..............................................................................................................................................

(ලකුණු 03)

12. "කණ්ඩායම්" සහ "වැඩ කණ්ඩායම්" අතර ඇති වෙනස්කම් මොනවාද?

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

(ලකුණු 03)

13. අයහපත් ගැටුම්වලින් යහපත් ගැටුම් වෙන්කර හඳුනා ගැනීමට ඔබ සලකා බැලිය යුතු ගැටුම් වර්ග මොනවාද?

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

(ලකුණු 03)

14. රොබට් කාර්ට්ස් විසින් හඳුනාගෙන ඇති අත්‍යවශ්‍ය කළමනාකරණ කුසලතා තුන (03) නම් කරන්න.

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

(ලකුණු 03)

15. සංවිධාන ව්‍යුහයේ ස්වරූපයට (Design) බලපාන සාධක හතරක් (04) නම් කරන්න.

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

(ලකුණු 04)

16. හෙන්රි මින්ට්ස්බර්ග් හඳුන්වාදුන් නායකත්ව කාර්යභාරයන් (Role of leadership) හතරක් (04) නම් කරන්න.

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

.................................................................................................................................................

(ලකුණු 04)

(මුළු ලකුණු 40)

## II - කොටස

මෙම කොටසේ දී ඇති ප්‍රශ්න පහෙන් (05) ඕනෑම තුනකට (03) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න අංක 01**

(අ) "අප යමක් ඉගෙනගත් පමණින් අපේ චර්යාවේ වෙනසක් සිදුවේ යැයි අදහස් නොවේ". සමාජ ඉගෙනුම් න්‍යායේ ඇති ඉගෙනුම් ක්‍රියාවලිය යොදාගෙන මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ආ) පහත දී ඇති සිද්ධියට අදාළව එම සේවකයාගේ චර්යාව ඔබ පුරෝකථනය කරන්නේ කෙසේද? පැවරුම් න්‍යාය (Attribution theory) යොදාගෙන ඔබේ පිළිතුර පැහැදිලි කරන්න.

"විරාජ් විසින් A යන්ත්‍රය යොදාගෙන ගුණත්වයෙන් අඩු භාණ්ඩ නිපදවයි".

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්න අංක 02**

(අ) සංවිධානයක සංස්කෘතිය කුමන ස්වරූපයේ එකක් ද යන්න තීරණය කිරීමෙහි ලා බලපාන මූලික ලක්ෂණ හඳුනාගෙන කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 08)

(ආ) "ගැටුමක් යන්න පැහැදිලි කරන විට අප බොහෝ විට සැලකිල්ලට ගන්නේ එහි අපට පෙනෙන්නට තිබෙන තත්වය පමණි. නමුත් එය ගැටුම් ක්‍රියාවලියේ එක් කුඩා කොටසක් පමණි. ගැටුමක් යනු, පියවර කිහිපයකින් සමන්විත ක්‍රියාවලියකි.

ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

**ප්‍රශ්න අංක 03**

(අ) "පුද්ගල පෞරුෂත්ව සංවර්ධනය සඳහා ජන්මය /ආවේණිය (Heredity) බලපෑම් නොකරයි".

i. මෙම ප්‍රකාශය තහවුරු කිරීම සඳහා තර්කයක් ගොඩ නඟන්න.

ii. මෙම ප්‍රකාශයට විරුද්ධ තර්කයක් ගොඩ නඟන්න.

(ලකුණු 06)

(ආ) පුද්ගලයින් තම බල මූලාශ්‍ර ක්‍රියාවට නැංවීමට යොදා ගන්නා බල උපක්‍රම (Power tactics) මොනවාද?

(ලකුණු 07)

(ඇ) දේශපාල චර්යාවන් යනු කුමක්ද? නීත්‍යානුකූල හා නීත්‍යානුකූල නොවන දේශපාල චර්යාවන් ඔබ වෙන් කර හඳුනා ගන්නේ කෙසේද?

(ලකුණු 07)

(මුළු ලකුණු 20)

## ප්‍රශ්න අංක 04

(අ) අන්තර් පුද්ගල සන්නිවේදනය සඳහා යොදාගත හැකි ක්‍රම මොනවාද? ඒ එක් එක් ක්‍රමයේ වාසි හා අවාසි ලැයිස්තුගත කරන්න.

(ලකුණු 08)

(ආ) "කණ්ඩායම් සන්තකයන් (Properties) කණ්ඩායම් ව්‍යුහය විස්තර කරන අතර කණ්ඩායම තුළ පුද්ගලයන්ගේ චර්යාව හා කාර්යසාධනය පුරෝකථනය කරයි".
සුදුසු උදාහරණ යොදා ගනිමින් මෙම ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 12)

(මුළු ලකුණු 20)

## ප්‍රශ්න අංක 05

(අ) එක් නායකත්ව න්‍යායක් කෙටියෙන් විස්තර කර එය නූතන සංවිධානවලට සම්බන්ධ කළමනාකරුවකුගේ චර්යාව පැහැදිලි කිරීමට අදාළ කරගත හැක්කේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(ආ) සංවිධාන වෙනස්වීම කෙරෙහි බලපාන බලවේග (Forces for change) මොනවාද? සැලසුම් සහගත සහ සැලසුම් සහගත නොවන වෙනස්කම් අතර වෙනස කුමක්ද?

(ලකුණු 10)

(මුළු ලකුණු 20)